රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 20/2021

මගේ අංකය : F/FR/03/BRCir
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.10.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී - 20.02.01.01)**

රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් ගණන් දීමේ නිලධාරී ලෙස 2015.01.01 දින සිට "රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්" කටයුතු කරන බැවින් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම යන කාර්යයන් මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත.

02. ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා වාර්තා කිරීම විධිමත් හා යාවත්කාලීන කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් ජාලගත පරිගණක මෘදුකාංගයක් සැකසීමට යෝජිතය. ඒ සඳහා දත්ත පද්ධතියක් පවත්වා ගැනීම සඳහා අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු / දිස්ත්‍රික් ලේකම් කාර්යාල සතු නිල නිවාස/ සංචාරක බංගලා/ නිවාඩු නිකේතන/ වාණිජ ගොඩනැගිලි/ ගබඩා/ වෙනත් (ආපන ශාලා/ ශ්‍රවණාගාර/ කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි) පිළිබඳ තොරතුරු මේ සමඟ අමුණා ඇති ආකෘති අනුව නිසි පරිදි සම්පූර්ණ කර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් ලිපිනයට මෘදු පිටපතක්ද සහිතව 2021.11.30 දිනට පෙර ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කර මෙම කටයුතු සාර්ථක කර ගැනීමට දායක වන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| ආකෘති නාමය | ආකෘති අංකය |
|---|---|
| 1.රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී පිළිබඳ කටයුතු කරන නිලධාරීන්ගේ තොරතුරු | 01 |
| 2.නිල නිවාස සංඛ්‍යාව සහ නිල නිවාස පිළිබඳ තොරතුරු | 02 |
| I. උපලේඛණ ගත නිල නිවාස | 02 අ |
| II. උපලේඛණ ගත නොවූ නිල නිවාස | 02 ආ |
| 3.සංචාරක බංගලා / නිවාඩු නිකේතන පිළිබඳ තොරතුරු | 03 |
| 4.වාණිජ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු | 04 |
| 5.ගබඩා පිළිබඳ තොරතුරු | 05 |
| 6.වෙනත් (ආපන ශාලා ,ශ්‍රවණාගාර ,කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි ) | 06 |

03. ඇතැම් ආයතන විසින් මෙහි සඳහන් සියලු ප්‍රභවයන්ගේ ආදායම් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී (20.02.01.01) ආදායම් සංකේතාංකයට බැර නොකරන බව විගණන විමසුම් වලට ලක්ව ඇති බැවින් මේ පිළිබඳ විශේෂ අවධානය යොමුකර ඉහත සඳහන් **සියලු ප්‍රභවයන්ගේ ආදායම් රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී (20.02.01.01) ආදායම් සංකේතාංකයට බැර කිරීමට කටයුතු කළ යුතුය.**

04. තවද රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී වලට සම්බන්ධ පහත සඳහන් වාර්තා අදාල කාල රාමුව තුල ඉදිරිපත් කර ආදායම් එකතු කිරීම් විධිමත් කර ගැනීම සඳහා සහයෝගය ලබාදෙන මෙන් දන්වමි.

| වාර්තාවේ නම | ඉදිරිපත් කළ යුතු ආකාරය | ආකෘතිය හා උපදෙස් |
|---|---|---|
| අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා | ආදායම් වර්ෂයේ 6/30 හා 12/31 දිනට හිඟ ආදායම් වාර්තාව අදාල චක්‍රලේඛයේ සඳහන් දිනට පෙර පිළියෙල කර මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. | චක්‍රලේඛය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ චක්‍රලේඛ යටතේ අදාල කාල සීමාව තුල පළ කරනු ලබයි. |
| ආදායම් ඇස්තමේන්තුව | ඉදිරි වර්ෂයට අදාලව පිළියෙල කරන වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව අදාල චක්‍රලේඛයේ සඳහන් දිනට පෙර මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය | |
| මාසික ආදායම් වාර්තා | ඔබ විසින් රැස්කරන මාසික ආදායම් පිළිබඳ වාර්තාවක් Repo.01 අනුව සකසා ඊළඟ මස 15 වන දිනට ප්‍රථම "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් ලිපිනයට මෘදු පිටපතක්ද සහිතව ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය | ඇමුණුමේ ඇති Repo.01 අනුව පිළියෙල කළ යුතුය. |
| ආදායම් හර කිරීම් | ඔබ විසින් රජයේ ගොඩනැගිලි කුලී 20.02.01.01 ආදායම් ශීර්ෂයට කරනු ලබන හර කිරීම් පිළිබඳ විස්තර Repo.02 අනුව සකසා ඊළඟ මස 15 දිනට ප්‍රථම ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය | ඇමුණුමේ ඇති Repo.02 අනුව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| ආදායමින් ආපසු ගෙවීම | ආදායමින් ආපසු ගෙවීම සඳහා පොදු 29 ආකෘති පිටපත් 02 සම්පූර්ණ කර අදාල අනෙකුත් ලිපි සමඟ මෙම අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ලබා ගත යුතුය. | පොදු 29 ආකෘති 02 ක් (මුල් පිටපත් විය යුතුය), ඉල්ලීම් ලිපිය, අයකිරීම් පිළිබඳ වැටුප් වාර්තා, විශාල මුදලට අදාල භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සහ අදාල අනෙකුත් ලේඛන (මුල් පිටපත් නොවේ නම් සහතික කරන ලද පිටපත් වියයුතුය) |

05. මු.රෙ.127 (6) සහ මු.රෙ.128 (2) ඉ විධිවිධාන අනුව 20.02.01.01 ආදායම් සංකේතාංකයට අදාල හිඟ ආදායම් එකතු කිරීමේ වගකීම ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් මට ද අදාල ආයතනයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් ඔබට ද පැවරී ඇති අතර හිඟ ආදායමක් ඇති නොවන පරිදි හිඟ ගොඩනැගිලි හා නිවාස කුලිය අයකර ගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආකෘති අංක 01

01. රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී පිළිබඳ කටයුතු කරන නිලධාරීන්ගේ තොරතුරු

| | |
|---|---|
| අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | |
| අංශය/ශාඛාව | |

අදාල මාණ්ඩලික නිළධාරියා පිළිබඳ විස්තර:-

| නම | තනතුර | ලිපිනය | දුරකථන අංකය | ෆැක්ස් අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

අදාල විෂය භාර නිළධාරියා පිළිබඳ විස්තර:-

| නම | තනතුර | දුරකථන අංකය | විද්‍යුත් තැපැල් ලිපිනය |
|---|---|---|---|
| | | | |

**02.**නිල නිවාස ගණන

| නිවාස කාණ්ඩය | නිල නිවාස සංඛ්‍යාව |
|---|---|
| උපලේඛණ ගත නිල නිවාස | |
| උපලේඛණ ගත නොවූ නිල නිවාස | |

**02.(අ)** උපලේඛණ ගත නිල නිවාස

| අනු අංකය | නිවාසයේ නම | නිවාසයේ අංකය | ලිපිනය | වරිපනම් අංකය | පදිංචිකරුගේ නම | පදිංචිකරුගේ තනතුර හා සේවා ස්ථානය | කුලී අයකරන පදනම (කුලී ප්‍රතිශතය/තක්සේරු කුලිය/ආර්ථික කුලිය ) | **2021.06.30** දින දක්වා සමුච්චිත හිඟ මුදල | හිඟ කුලිය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

02. **(ආ)** උපලේඛණ ගත නොවූ නිල නිවාස

| අනු අංකය | නිවාසයේ නම | නිවාසයේ අංකය | ලිපිනය | වරිපනම් අංකය | පදිංචිකරුගේ නම | පදිංචිකරුගේ තනතුර හා සේවා ස්ථානය | කුලී අයකරන පදනම (කුලීප්‍රතිශතය/තක්සේරු කුලිය/ආර්ථික කුලිය ) | **2021.06.30** දින දක්වා සමුච්චිත හිඟ මුදල | හිඟ කුලිය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

ආකෘති අංක 03

**03.** සංචාරක බංගලා / නිවාඩු නිකේතන පිළිබඳ තොරතුරු

| සංචාරක බංගලා / නිවාඩු නිකේතන | සංඛ්‍යාව |
|---|---|
| සංචාරක බංගලා | |
| නිවාඩු නිකේතන | |

| අනු අංකය | සංචාරක බංගලා / නිවාඩු නිකේතන පිහිටි ස්ථානය | ලිපිනය | දිකකට අයකරනු ලබන ගාස්තුව | 2021.06.30 දින දක්වා සමුච්චිත හිඟ මුදල | හිඟ කුලිය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ආකෘති අංක 04

**04.** වාණිජ ගොඩනැගිලි පිළිබඳ තොරතුරු

| අනු අංකය | ගොඩනැගිල්ලේ නම | ගොඩනැගිල්ලේ ස්වාභාවය | ගොඩනැගිල්ල කුලියට/ බද්දට ලබාදී ඇති ආයතනය හෝ පුද්ගලයන්ගේ නම් | ගොඩනැගිල්ල කුලියට/ බද්දට ලබාදී ඇති ආයතනය හෝ පුද්ගලයන්ගේ ලිපිනයන් | වරිපනම් අංකය | වර්ග අඩි ගණන | මාසික කුලිය | කුලී අයකරන පදනම (මාසික/අර්ධ වාර්ෂික/වාර්ෂික) | 2021.06.30 දින දක්වා සමුච්චිත හිඟ මුදල | හිඟ කුලිය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

ආකෘති අංක 05

05. ගබඩා පිළිබඳ තොරතුරු

| අනු අංකය | ගබඩා ලබාදී ඇති කුලීකරුගේ/ බදුකරුගේ නම | කුලීකරුගේ/ බදුකරුගේ ලිපිනය | වරිපනම් අංකය | ගබඩාවේ ස්වභාවය | මාසික කුලිය | කුලී අයකරන පදනම (මාසික/අර්ධ වාර්ෂික/වාර්ෂික) | 2021.06.30 දින දක්වා සමුච්චිත හිඟ මුදල | හිඟ කුලිය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

ආකෘති අංක 06

**06.වෙනත් (ආපන ශාලා ,ශ්‍රවණාගාර ,කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි)**

| අනු අංකය | විස්තරය (ආපනශාලාව.ශ්‍රවණාගාර,වෙනත් ගොඩනැගිලි) | කුලීකරුවන්ගේ /බදුකරුවන්ගේ නම (අදාල වේ නම් පමණි ) | කුලීකරුවන්ගේ /බදුකරුවන්ගේ ලිපිනය | දෛනික කුලිය/මාසික කුලිය | කුලී අයකරන පදනම (දෛනික/මාසික/අර්ධ වාර්ෂික/වාර්ෂික) | 2021.06.30 දින දක්වා සමුච්චිත හිඟ මුදල | හිඟ කුලිය අයකර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

ආකෘති පත්‍ර අංක :- **REPO / 01**

<u>ආදායම් ශීර්ෂ අංක **20.02.01.01** (රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී)</u>

මාසික ආදායම් වාර්තාව **2021** ...................... මාසය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ....................................

භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සංකේතය .................................................

| අනු අංකය | විස්තරය | පසුගිය මාසය දක්වා ආදායම (රු.) | මෙම මස ආදායම (රු.) | මේ දක්වා මුළු ආදායම ( රු.) |
|---|---|---|---|---|
| **01** | නිල නිවාස | | | |
| **02** | සංචාරක බංගලා / නිවාඩු නිකේතන | | | |
| **03** | වාණිජ ගොඩනැගිලි | | | |
| **04** | ගබඩා | | | |
| **05** | වෙනත්(ආපනශාලා ,ශ්‍රවණාගාර ,කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි) | | | |
| | එකතුව | | | |
| | මාසික ගිණුම් සාරාංශ මඟින් බැර කළ මුදල | | | |
| | අඩුකළා:- මාසික ගිණුම් සාරාංශ අනුව හර කළමුදල | | | |
| | ශුද්ධ ආදායම | | | |

*ඉහත **1,2,3,4,5** යටතේ ආදායම වෙන් වෙන්ව දැක්විය යුතුය.

සකස් කළේ .....................

පරීක්ෂා කළේ...................

ප්‍රධාන ගණකාධිකාරි:- ...............................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

දිනය :.........................

ආකෘති පත්‍ර අංක :- REPO / 02

ආදායම් ශීර්ෂ අංක- 20.02.01.01 (රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී)

මාසික ගිණුම් සාරාංශ මඟින් ආදායම් හර කිරීම 2021 ...................... මාසය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ...................................

භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සංකේතය .................................................

| | | | |
|---|---|---|---|
| හර කරන ලද මුළු මුදල | | | xxx |
| හර කිරීම සඳහා හේතුව | | මුදල | |
| 01. | ගණනය කිරීමේ දෝෂ | xx | |
| 02. | ආදායමින් ආපසු ගෙවීම් | xx | |
| 03. | වෙනත් | xx | |
| එකතුව | | | xxx |

ඉහත 2 යටතේ ආදායමින් ආපසු ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගත් පාර්ශවය, ලිපි අංකය හා දිනය :

....................................................................................................................................

....................................................................................................................................

ඉහත 1,2,3 යටතේ දක්වන ලද හරකරන ලද රජයේ ගොඩනැගිලි කුලී ආදායම් සඳහා හේතුවූ කරුණු සවිස්තරාත්මකව පහතින් දැක්විය යුතුය.

....................................................................................................................................

....................................................................................................................................

............................................

ප්‍රධාන ගණකාධිකාරි:- .................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / දිස්ත්‍රික් ලේකම්කාර්යාලය